ලිංගික අපරාධ පිළිබඳව වාර්තා කිරීමේදී තවමත් බොහෝ මාධ්‍ය "දූෂණය" යන යෙදුමෙන් එය හඳුන්වනු දක්නට ලැබේ. නීති පොත් වලද තවමත් පවතින්නේ "දූෂණය" යන යෙදුම යැයි කීම මුසාවක් නොවේ.
කෙසේ නමුත්, "දූෂණය" යන යෙදුම මගින් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන හෙයිනුත්, එම යෙදුම හා ගර්හාත්මක ආකල්පයක් බැඳී ඇති බැවිනුත්, එවැනි අවස්ථාවන් සඳහා ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය වැනි යෙදුමක් යොදාගැනීම වඩාත් උචිත යැයි අපි පවසමු.
මීට උදාහරණ ලෙසින්, එකම සිදුවීමක් සම්බන්ධව ජූලි 19 සහ ජූලි 20 දෙදින මව්බිම පුවත්පතේ පුවත් වාර්තාවන් දෙකක් ගත හැක. මෙහි එක් පුවත් වාර්තාවක "දූෂණය" යන යෙදුමෙන් අදාළ ලිංගික අපරාධය දැක්වෙන අතර, අනෙක් පුවත් වාර්තාවේ වඩාත් නිවැරදි ලෙසින් "අපයෝජනය" යන යෙදුම සඳහන්ව තිබේ.
මේ පිළිබඳව ඔබේ අදහස් මොනවාද?
#MediaEthicsSL #lka #sinhalanews #Mawbima